


# ඇරුම පුදුම ඇල ගෙඩිය

කතාව සහ චිත්‍ර
සෙතුලි අටුගොඩ

# අරුම පුදුම අල ගෙඩිය

සෙතුලි අටුගොඩ

# අරුම පුදුම අල ගෙඩිය

## සෙතුලි අටුගොඩ

කතෘගේ වෙනත් කෘති
සමනල් බබයි යාළුවෝ ටිකයි

මහාමායා බාලිකා විදුහල
4 ශ්‍රේණිය D
2026-05-10

© සෙතුලි අටුගොඩ
ISBN 978 - 624 - 211 - 145 -2

පිදුම

*මා හට අකුරු කියාදී*

*යහමග පෙන්වූ*

*ගුරු මෑණිවරුන්ට, ගුරු පියවරුන්ට සහ දෙමාපියන්ට*

*ආදරයෙන්*

*පුදමි.*



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි.  මේ සඳහා නිර්මානකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# <u>සුභාශිංසන පණිවුඩය</u>

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# <u>සුභාශිංසන පණිවුඩය</u>

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,<br>
දියවඩන නිලමේ,<br>
ශ්‍රී දළදා මාලිගාව<br>
2026.05.10

එකමත් එක දවසක මී පැටියෙක් කැලයක් මැදින් ගමනක් ගියා. එතකොට කහ පාට පුංචි යමක් පසෙන් උඩට මතු වී තිබෙණු මී පැටියා දුටුවා. මී පැටියා හනික ගෙදරට දුවලා ගියා.



මී පවුලේ හැමෝටම ඇහෙන්න, "එන්න එන්න හනික යමු. නුග ගහ යට පොළොවේ කහ පාට දෙයක් මට නම් හිතෙන්නේ හොඳ කෑමක් කියලා" මී පැටියා කීවා. හැමෝම හනික එතනට ගියා.



මී තාත්තා ඒ කහ පාටට තිබුණු දෙය හොඳට ඉව කළා. මී අම්මා ඒක වටේට ගිහින් හොඳින් බැලුවා.

"මේක නම් රස කෑමක් වගෙයි " මී අම්මා කීවා. "ඒක හැබැයි, අපිට මේක සෑහෙන කාලයක් කන්න පුළුවන් වෙයි " මී තාත්තා පැවසුවා.



"මේක මොකක්ද? අල ගෙඩියක් නෙමෙයිද? " මී පැංචා ඇහුවේ හරිම දුකින් .

"පොඩ්ඩක් ඉන්නකෝ පුතේ. අපි හිමිට මේක හාරමු" මී තාත්තා මී පැංචාට කිවුවා.

හැමෝම වටවෙලා ඒක හාරන්න සුදානම් වුණා.



හැමෝම එකතු වෙලා එතන හාරන්න ගත්තා.

ආ... ඔව්මයි මේක අල ගෙඩියක් මී පැංචාගේ පවුලම හරි සතුටින් උඩ පැන්නා.

ඒත් ඒ අලගෙඩිය ලේසියෙන් උඩට ආවේ නම් නෑ.



"හරිම අමාරුයි. මට නම් මේක කන්න ඕනි නෑ" මී අක්කා කිවුවා
"අනේ... මට නම් කන්න ඕනි තාත්තේ අපිට මේක ගෙදර ගෙනියන්න බැරිවෙයිද? "
මී පැංචා අඬන්න ගත්තා.



හදිසියේම මී පැටියා එතනින් දුවන්න ගත්තා.


පුතේ කොහෙද යන්නේ........? මී අම්මා ඇහුවා.

පොඩ්ඩක් ඉන්නකෝ අම්මේ කියලා මී පැංචා කැලේ පැත්තට දුවන්න ගත්තා.



"මෙන්න යාළුවෝ කට්ටිය ම එක්කන් එනවා". මී අයියා කෑගැහුවා.

ඌරු පැටියයි, ඉත්තෑරාළයි ඇවිත් යටින් පස් හෑරුවා. හා හාමිත් තල්ලු කළා. ඒත් තාම අල ගෙඩිය හෙලවුණේ වත් නෑ.



මී පැටියා හරිම දුකෙන් අලගෙඩිය දිහා බලන් හිටියා.

ඒක දැකපු වඳුරු හාමි හනිකට අත්තෙන් අත්තට පැනලා ගඟ පැත්තට ගියා.



මෙන්න.... වඳුරු හාමි ගිහින් තියෙන්නේ අලි රාළව එක්කරගෙන එන්න. අලි රාළත් දැක්කා මී පැංචා දුකින් ඉන්නවා. වඳුරු හාමි අලි රාළගේ කනට කරලා කීවා වෙලා තියෙන දේ.



අලිරාළ හිමින් සැරේ අල ගෙඩිය ළඟට ආවා.

එයාගේ හොඬවැල උස්සලා..... කරකවලා... අල ගෙඩිය අරගෙන මී පැංචා ළඟින් තිබ්බා.

මී පැංචාට හරිම සතුටුයි. එයා උඩ පැන්නා. වටේ හිටපු හැමෝටමත් හරිම සතුටුයි.



අලිරාළ ආයමත් සැරයක් මී පැංචා ළඟට ඇවිත් අලගෙඩිය එයාගේ හොඬවැලින් අරන් මී පැංචාගේ ගෙදර ගාවට අරන් යන්න සූදානම් වුණා. උදවුවට ආපු යාළුවෝ හැමෝම ආපහු යෑමට සූදානම් වුණා.

“කොහෙද මේ ඔයාලා යන්න හදන්නේ” මී පැංචා ඇහුවා.



“ඔව්, ඔව්. යාළුවෝ කාටවත් එහෙම යන්න බෑ. හැමෝම එන්න අපේ ගෙදර. පුතාගේ සතුට බෙදා ගන්න”.

මී අම්මා සැමදෙනාටම ආරාධනා කළා...

යාළුවෝ හැමෝම ඒ ආරාධනාව පිළිගෙන, මී පැංචාගේ ගෙදර ගාවට ආවා.



මී අම්මයි, මී අක්කයි එකතුවෙලා අල ගෙඩිය කෑලිවලට කපලා යාළුවන්ට පිළිගැන්නුවා.

හැමෝම අලගෙඩිය රසවිඳලා, මී පැංචාටයි, මී පවුලේ අනිත් අයටයි ස්තූති කරලා සතුටින් එතනින් පිටත් වුණා.



අපිත් අන්න ඒ වාගේ සහයෝගයෙන් වැඩ කරන්න. අනිත් අයට උදවු කරන්න වගේම ඕනම දෙයක් බෙදා හදා ගෙන කෑමට පුරුදු වෙන්න ඕනි.





# පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ලා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතු බව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආශ්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **"හේමමාලා උපහාර"** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලමේ තුමන් ඇතුළු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සත්කාරය වෙනුවෙන් ස්තූති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
(ව්‍යාපෘති නිර්මාතෘ)